00029

**ශ්‍රී ලංකා විවෘත විශ්ව විද්‍යාලය**
**මානව ශාස්ත්‍ර හා සමාජ විද්‍යා පීඨය**
**නීති අධ්‍යයන දෙපාර්තමේන්තුව**
**නීතිවේදී උපාධි පාඨමාලාව - 2023/2024**
**අඛණ්ඩ ඇගයීම් පරීක්ෂණය I**
**5 වන මට්ටම**
**පොදු අන්තර්ජාතික නීතිය - LLU5712**
**කාලය පැය (01) එකයි**

---

දිනය - 2024 නොවැම්බර් 07 වේලාව - ප.ව. 03.30 – ප.ව.04.30

---

අපැහැදිලි අත් අකුරු සඳහා ලකුණු අඩු කරනු ලැබේ.

පහත සිදුවීම සලකා බලමින් දී ඇති සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

1. අග්නි සහ වරුණ ගෝලීය දකුණෙහි අසල්වැසි රාජ්‍යයන් දෙකක් වන අතර ඔවුන් එක්සත් ජාතීන්ගේ සංවිධානයේ සාමාජිකයන්ය. පසුගිය වසරේ අග්නි රාජ්‍යයේ හමුදා නොසන්සුන්තාවයක් ඇති විය. කෙසේ වුවද මෙම හමුදා නොසන්සුන්තාවය සාර්ථක නොවීය. අග්නි රාජ්‍යයේ 'මහජන විප්ලවකාරී සන්ධානය' හි නායක වික්ටර් මෙම හමුදා නොසන්සුන්තාවය සංවිධානය කිරීම සම්බන්ධයෙන් චෝදනා ලැබීය. නීතිමය කාර්ය පටිපාටිය ආරම්භ කිරීමට මාස තුනකට පෙර, වික්ටර් වරුණ රාජ්‍යයෙන් දේශපාලන රැකවරණය ඉල්ලා සිටියේය. අග්නි රාජ්‍යයේ, වරුණහි තානාපති කාර්යාලය වික්ටර්ට රැකවරණය ප්‍රදානය කළේය. වරුණ රාජ්‍යය විසින් ප්‍රදානය කරන ලද රැකවරණයෙහි නීත්‍යානුකූල වලංගුභාවය සම්බන්ධයෙන් අග්නි රාජ්‍යය දැන් ප්‍රශ්න කරයි. ඊට පටහැනිව වරුණ රාජ්‍යය තර්ක කර සිටින්නේ රැකවරණය ප්‍රදානය කිරීම සහ දේශපාලන වින්දිතයන් ආරක්ෂා කිරීම සම්බන්ධයෙන් ගෝලීය දකුණෙහි රාජ්‍යයන් අතර අනාදිමත් කාලයක සිට පැවත එන ස්ථිර පරිචයක් (Practice) ඇති බවයි. චෝදනා ලද අපරාධය වික්ටර් සිදුකිරීම සම්බන්ධයෙන් කිසිදු සාක්ෂියක් මේ වනතෙක් නොමැති අතර අග්නි සහ වරුණ අතර මේ කාරණය සම්බන්ධයෙන් එකඟතාවයක් ද නොමැති බැවින්,පෙර පරිචයන් අනුව වික්ටර්ට අඛණ්ඩව රැකවරණය සැපයීමට වරුණ රාජ්‍යය බලාපොරොත්තු වෙයි. තවදුරටත්, වරුණ රාජ්‍යය පෙන්වා දෙන්නේ අතීතයේ, අග්නි රාජ්‍යයද වෙනත් රාජ්‍යයන්හි දේශපාලන වින්දිතයන් සඳහා රැකවරණය ප්‍රදානය කිරීමේ සිදුවීම් තිබූ බවයි. රාජ්‍යයන් ද්විත්වය මෙම ගැටලුව අන්තර්ජාතික යුක්ති අධිකරණයට ඉදිරිපත් කිරීමට බලාපොරොත්තු වෙති.

**සටහන - රැකවරණය යන්නට අන්තර්ජාතික නීතියේ සාමාන්‍ය නිර්වචනය වන්නේ විදේශ පුරවැසියෙකුට ඔහුගේ/ඇයගේ රාජ්‍යයට විරුද්ධව ආරක්ෂාව ප්‍රදානය කිරීමයි.**

ඇ) අන්තර්ජාතික යුක්ති අධිකරණ ප්‍රඥප්තියේ 38 ව්‍යවස්ථාව අනුව අග්නි සහ වරුණ යන රාජ්‍යයන් ද්විත්වයට මෙම ගැටළුව කෙසේ නිරාකරණය කර ගැනීමට හැකි වන්නේදැයි ඔබ සිතන්නේද? අදාල නෛතික අධිකාරින් සමඟ සාකච්ඡා කරන්න.

(ලකුණු 15)

ආ) අග්නි රාජ්‍යය ගෝලීය දකුණ කලාපයේ දේශපාලන වින්දිතයන්ට රැකවරණය ලබාදීම සම්බන්ධයෙන් අඛණ්ඩව විරුද්ධත්වය පළකර තිබුණි නම් එහි බලපෑම කුමක්ද?

(ලකුණු 05)

(15 + 05 = ලකුණු 20)

**සියලුම හිමිකම් ඇවිරිණි.**